දුරකථන ) 0112669192, 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. )CF/EXW/13/2025

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2025/05/30
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02 – 80/2025

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල - කොළඹ,

අධ්‍යක්ෂ ජාතික රෝහල - මහනුවර,

අධ්‍යක්ෂ ජාතික රෝහල - ගාල්ල,

රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ PL – 03 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියම කර ඇති පාලන මැදිරි ක්‍රියාකරු, මෝටර් කාර්මික, රෝහල් ඕවසියර්, විදුලි කාර්මික හා සිනමා යන්ත්‍ර ක්‍රියාකරු II වන ශ්‍රේණියේ තනතුරු සඳහා නියමිත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2025 (දෙවන වාරය)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය PL – 03 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියම කර ඇති පාලන මැදිරි ක්‍රියාකරු, මෝටර් කාර්මික, විදුලි කාර්මික, රෝහල් ඕවසියර්, සිනමා යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා II ශ්‍රේණියට පත්වී වසර 03 ක් ගතවීමට පෙර සමත් විය යුතු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යවලින් **2025/08/31** දින පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. **සුදුසුකම්**

මෙම විභාගයට අයදුම්කල යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය PL – 03 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියම කර ඇති තනතුරක (පාලන මැදිරි ක්‍රියාකරු, මෝටර් කාර්මික, රෝහල් ඕවසියර්, විදුලි කාර්මික හා සිනමා යන්ත්‍ර ක්‍රියාකරු) II ශ්‍රේණියේ පත්වීමක් ලබා සිටින හා මේ වන විට විභාගය සම්පූර්ණ නොකරන ලද නිලධාරීන්ට පමණි.

සැ.යු. : සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 02-90/2015 හා 2015.08.12 දිනැති පොදු චක්‍රලේඛ ලිපියෙහි සඳහන් පරිදි 2012.07.27 දිනට විදුලි කාර්මික හා සිනමා යන්ත්‍ර ක්‍රියාකරු යන තනතුරුවල II ශ්‍රේණියේ වසර තුනක් (03) ඉක්මවා ඇති නිලධාරීන් මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කර ඇති බැවින් ඔවුන් මේ සඳහා පෙනී සිටිය යුතු නොවේ.

**මෙම විභාගයට අයදුම්කල හැක්කේ 2025/06/25 වනවිට II ශ්‍රේණියට පත්කර, අදාල පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න. (II ශ්‍රේණියට පත් කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමඟ අමුණා එවීම අනිවාර්ය වේ.)**

03. **අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව අයදුම්කරුවන් විසින් සකස් කර ගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385 "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (විභාග) වෙත **2025/06/25** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙලවරෙහි **"PL – 03 – 2006 (ඒ) II වන ශ්‍රේණියේ තනතුරු සඳහා නියමිත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2025 (දෙවන වාරය)"** ලෙස සඳහන් කළ යුතුය. **මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියා විසින් ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බවට ආයතන ප්‍රධානියා විසින් ද සහතික කර තිබීම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමග රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු 110.00 ක් වටිනා මුද්දර ඇලවූ 9"X 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු. :- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 03 දක්වාත් දෙවන පිටුවේ අංක 04 සිට 08 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

04. **විභාග ගාස්තු**

I. විභාගයට පළමුවරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ

05. **විභාගයට ඇතුලත් කර ගැනීම.**

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත්‍ර නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාල ආයතනයන් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. **විභාග පරිපාටිය**

මෙම විභාගය ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි යන විෂයයන්ගෙන් යුත් රචනා මාදිලියේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. එම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහය කොටසින් ප්‍රශ්න 04 ක් හා මුදල් රෙගුලාසි කොටසින් ප්‍රශ්න 03 ක් වශයෙන් ප්‍රශ්න 07 කින් යුක්ත වේ. එක් කොටසකින් ප්‍රශ්න 02 බැගින් තෝරා ප්‍රශ්න 04 කට පිළිතුරු ලිවිය යුතුය. මුළු ලකුණු 100 යි. සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය. කාලය පැය 01½ කි.

විෂයය නිර්දේශය

ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය

07:1 ආයතන සංග්‍රහය

| | | | |
|---|---|---|---|
| XXI | පරිච්ඡේදය | - | ආරක්ෂක ඇඳුම් හා නිල ඇඳුම් |
| XXII | පරිච්ඡේදය | - | සුභ සාධක පහසුකම් |
| XXIII | පරිච්ඡේදය | - | ඇතැම් වර්ග වල ලෙඩ රෝගවලින් පෙලෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV | පරිච්ඡේදය | - | වැටුප් ණය සහ අත්තිකාරම් |
| XXV | පරිච්ඡේදය | - | වෘත්තීය සංගම්වල සාමාජිකයන් හට අනුග්‍රහ |

07:2 මුදල් රෙගුලාසි - මුදල් රෙගුලාසි 124 සිට මුදල් රෙගුලාසි 134 දක්වා

08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොළයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා පිළිතුරු ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන් ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණ ද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු අදාල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුලත් කර ඇත.

සැ. යු :- මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත් වේ.

යූ.ඒ.එස්. හර්ෂප්‍රිය සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) - II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

යූ ඒ එස් එච් සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

EXW

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

## ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ PL – 03 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියම කර ඇති පාලන මැදිරි ක්‍රියාකරු, මෝටර් කාර්මික, රෝහල් ඕවසියර්, විදුලි කාර්මික හා සිනමා යන්ත්‍ර ක්‍රියාකරු II වන ශ්‍රේණියේ තනතුරු සඳහා නියමිත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2025 (දෙවන වාරය)**

01. (අ) i. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) - ..............................................

..............................................

ii. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

iii. මුලකුරු සමග නම (සිංහලෙන්)- ..............................................

..............................................

iv. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) i. තනතුර - ..............................................

ii. II ශ්‍රේණියට පත්කල/ උසස් කළ දිනය - ..............................................

II ශ්‍රේණියට පත්කල/ උසස් කළ ලිපි අංකය - ..............................................

(II ශ්‍රේණියට උසස් කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත සමග අමුණන්න)

iii. 2012.07.27 දිනට II වන ශ්‍රේණියේ සේවා කාලය - ..............................................

iv. දැනට ලබන වාර්ෂික වැටුප - ..............................................

v. ජාතික හැඳුනුම්පත් අංකය -

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

vi. ජංගම දුරකථන අංකය -

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

vii. විද්‍යුත් ලිපිනය - ..............................................

02. (අ) දැනට සේවය කරන ආයතනය :– සිංහලෙන්..............................................

ඉංග්‍රීසියෙන් ..............................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ :– රේඛීය අමාත්‍යාංශයට ☐ පළාත් සභාවට ☐

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත :– ..............................................

(ඈ) සේවය කරන ආයතනය අයත් දිස්ත්‍රික්කය :– ..............................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"×4" ප්‍රමාණයේ රු 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද ? ..............................................

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන්) - ..............................................

..............................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..............................................

..............................................

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - ..............................................

04. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ....................................................................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේද? ..............................

| |
|---|
| මුද්දර කොටුව |

05. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන්කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට* නොවන බැවින් රු......................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකග වන බවත් මෙයින් සහතික කරමි.

දිනය ...........................................  ..............................<br>අයදුම්කරුගේ අත්සන

06. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ සහතිකය**

මෙම අයදුම්පත භාරගන්නා අවසාන දිනයට පෙර/පසු මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය :-..................................  ..............................<br>නම සහ අත්සන

07. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

.................................................................................මහතා/ මහත්මිය/ මෙනෙවිය* ................................... නිලධාරියෙකු/නිලධාරිනියක වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට /නොවන* බවද රු............ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද / මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි. මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

දිනය :- .....................................  ..........................................<br>ආයතන ප්‍රධානියාගේ අත්සන<br>(රබර් මුද්‍රාව තැබිය යුතුය)

08. **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

................................................... මහතා/මහත්මිය/මෙනවිය*, ................................. නිලධාරියෙකු / නිලධාරිනියක වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය .........................  ..........................................<br>විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත<br>ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

(* අනවශ්‍ය කොටස් කපා හරින්න.)  [රබර් මුද්‍රාව තැබිය යුතුය]